www.agaram.lk

15396

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 09 | විෂය / பாடம் / Subject චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper I ,II | කාලය / காலம் / Time පැය 03යි. |

නම:-................................................ විභාග අංකයː-................................................

අයදුම්කරුවන්ට උපදෙස් **I පත්‍රය**

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම ලියන්න.

- පහත දැක්වෙන රූප සටහන හඳුනාගෙන අංක 01 සිට 05 දක්වා අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු ලියන්න.



01. මෙම රූප සටහනෙන් දැක්වෙන්නේ ................................................ වෙස් මුහුණකි.

02. මෙම කර්මාන්තය සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රසිද්ධිය උසුලන්නේ ................................................ ප්‍රදේශයයි. බෙන්තර, මිරිස්ස, රයිගම් කෝරලය, මතුගම, යන ප්‍රදේශවල ද මෙම කලාව ව්‍යාප්තව ඇත.

03. මෙම වෙස් මුහුණු හා සබැඳි කර්මාන්තය දේශීය ................................................ එකකි.

04. වෙස් මුහුණු නිර්මාණයේ දී පළමු පියවර ලෙස සැලකෙන්නේ ................................................ කැපීම ය.

05. වෙස් මුහුණු වර්ණ කිරීමේ දී ප්‍රථමයෙන් ම සුදු පැහැති ආලේපයක් තැවරීම සිදු වේ. මෙය ................................................ ගෑම ලෙස හැඳින්වේ.

ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

06. තහඩු වැඩ, වාත්තු වැඩ යන ශිල්ප ක්‍රම දෙක අයත්වන ජනකලා කර්මාන්තය වන්නේ,
1. වෙස් මුහුණු  2. පැදුරු  3. පිත්තල  4. ලාක්ෂා

07. පහත දැක්වෙන තේමාවලින් ග්‍රැෆික් චිත්‍ර ගණයට අයත් වන තේමාව වන්නේ,
1. සබන් දවටනයක්
2. චීත්ත රෙද්දක් සඳහා මල් මෝස්තරයක්
3. ගඟක දොළක දිය නාන අලි ඇතුන්
4. ආයත චතුරශ්‍රාකාර කුෂන් කවරයක් සඳහා නව නිර්මාණාත්මක මෝස්තරයක්

08. පර්යාලෝකය ලෙස හැඳින්වෙන්නේ
1. දිග පළල, ඝණත්වය, දැක්වෙන සිද්ධාන්තය ය.  2. චිත්‍රයක ළඟ, දුර, දැක්වීමේ සිද්ධාන්තය.
3. ද්විමාන ලක්ෂණ දැක්වීමේ සිද්ධාන්තය.  4. වයනය මතු කර දැක්වීමේ සිද්ධාන්තය.

09. මහනුවර යුගයේ චිත්‍ර ශිල්පීන් කාන්තා රූප එක්කර නිර්මාණය කර ඇති ප්‍රහේලිකා සිතුවම්වලින් කාන්තා රූප පහක් භාවිත කර ඇඳ ඇති මෝස්තර චිත්‍රය හඳුන්වන්නේ,
1. නවනාරි කුඤ්ජරය  2. චතුර්නාරි පල්ලැක්කිය
3. පංචනාරි ඝටය  4. සප්ත නාරි රථය



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

10. ශ්‍රී ලංකාවේ ප්‍රථම වර්ණ චිත්‍ර කතාව ලෙස හඳුන්වන ''නලදමයන්ති'' කතාව චිත්‍රණය කළ ශිල්පියා වන්නේ


1. දයා රාජපක්ෂ 2. බන්ධුල හරිශ්චන්ද්‍ර 3. ජනක රත්නායක 4. සෝලියස් මෙන්ඩිස්

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති රූප සටහන් හඳුනාගෙන නම් කරන්න.


11



12.



13.



………………………… ………………………… …………………………

14.




………………… ශිල්පියාගේ සිතුවමක්

15.




………………………… මුහුණ


- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා පිළිතුරු සැපයීමේදී A, B, C, D, E යන රූප සටහන් ඇසුරු කරගන්න.




A




B



C



D



E



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

16. "A" අක්ෂරයෙන් දැක්වෙන ජාතික ධජය නිර්මාණය කළ ශිල්පියා කවුරුන් ද? ..............................................

17. "B" අක්ෂරයෙන් දැක්වෙන වාහල්කඩ දක්නට ඇති ස්ථානය කුමක් ද? ..............................................

18. "C" අක්ෂරයෙන් දැක්වෙන ගෘහ නිර්මාණ අංගය හඳුන්වන නාමය කුමක් ද? ..............................................

19. "D" අක්ෂරයෙන් දැක්වෙන ශෛලමය නිර්මාණය හමුවන ස්ථානය කුමක් ද? ..............................................

20. "E" රූප සටහනෙන් දැක්වෙන සිංහ රථය (සිම්ම වාහනම්) නිර්මාණය කළ ශිල්පියා කවුරුන් ද? ..............................................

- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ඇති වාක්‍ය නිවැරදි නම් ( √ ) හරි ලකුණ ද වැරදි නම් ( X ) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

21. මනමේ, සිංහබාහු, බෙරහඬ යන නාට්‍යයන් ශෛලිගත නාට්‍ය නිර්මාණයන් ලෙස සැලකේ. ( )

22. පට්ටල් වැඩ, නියපොතු වැඩ යනු ලාක්ෂා භාණ්ඩ අලංකාර කිරීම සඳහා යොදා ගන්නා ප්‍රධාන ක්‍රම ශිල්ප දෙක වේ. ( )

23 දාගැබක ආරක්ෂාව සඳහා ඉදි කෙරෙන ගෘහය ථූපඝරය ලෙස හැඳින්වේ. ( )

24. පෝස්ටරයක් නිර්මාණයේදී පණිවිඩයේ වේගවත් බව පිළිබඳව සැලකිලිමත්වීම අත්‍යවශ්‍ය නොවේ. ( )

25. නිල් පැහැය ද්විතියික වර්ණයන්ගෙන් එකකි. ( )

- ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති එක් එක් වචනවල අර්ථය චිත්‍ර විෂයේදී විස්තර කෙරෙන ආකාරයට පැහැදිලි වන සේ වාක්‍ය බැගින් ලියන්න.

26. සාදිලිංගම් ..............................................

27. නෙළීම ..............................................

28. දොරණ තෙල් ..............................................

29. සන්නිදර්ශන චිත්‍ර ..............................................

30. බොරදම් ..............................................

- ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා වූ ප්‍රශ්න සඳහා හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

31. ශ්‍රී ලංකාවේ ප්‍රථම චිත්‍ර කතාව ජී.ඇස් ප්‍රනාන්දු ශිල්පියා විසින් .............................. නමින් ලංකාදීප පුවත්පතට 1951 දී නිර්මාණය කර ඇත.

32. මඤ්ජම් උත්සවය සඳහා භාවිත කරන මඤ්ජම් නැමැති තේර් රථයේ දේවරූප තැම්පත් කර ඇති පීඨිකාව හා ඉහළ කොටස සම්බන්ධ කරන කුළුණු විශේෂය .............................................. නමින් හැඳින්වේ.

33. ඉර හඳගල අඩ්ඩජන්ත පාෂාණ (අඩසඳ පහණ) පාටිකා යන නාමවලින් හැඳින්වෙන ශෛලමය නිර්මාණය .............................................. ය.

34. සිංහබාහු නාට්‍යයේ සිංහයාගේ චරිතයේ බාහිර ගති ලක්ෂණ ප්‍රබලව ඉස්මතුකර දැක්වීම සඳහා .............................................. මැනවින් භාවිත කර ඇත.

35. ස්වභාවික වස්තූන් හා නිර්මිත වස්තූන් රේඛාවෙන් අධ්‍යයනය කිරීම සඳහා .............................................. ශක්තීන් මතුකරන ආකාරය චිත්‍ර විෂයේ ප්‍රායෝගික අභ්‍යාසවලදී පුහුණු වී ඇත.



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

- පහත දැක්වෙන කලා කෘතිය හඳුනාගෙන එහි කලා ලක්ෂණ විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් එක් එක් ප්‍රශ්න අංක යටතේ දී ඇති උප ශීර්ෂවලට අනුව පිළිතුරු සපයන්න.




36. හඳුනාගත් බව ...........................................................................
37. යුගය ...........................................................................
38. මාධ්‍ය ...........................................................................
39. ශිල්ප ක්‍රමය ...........................................................................
40. ශිල්පීය දක්ෂතාව ...........................................................................

(ලකුණු 1x40=40)

## චිත්‍ර කලාව II පත්‍රය

### "අ" කොටස

- පහත දැක්වෙන රූප සටහන ඔබේ චිත්‍ර කඩදාසියට (තලයට) ගැළපෙන සේ ඇඳ ත්‍රිමාන ලක්ෂණ හ... ම ද්‍රව්‍යයන්ගේ ස්වභාවික ගති ලක්ෂණ මතුවන සේ පැන්සලෙන් වර්ණ කරන්න.



(ලකුණු 30

### "ආ" කොටස

පහත සඳහන් සියලුම මාතෘකා අතරින් <u>එකක්</u> තෝරාගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.

**ප්‍රකාශන චිත්‍ර**

1. වැසි දිනයක පාසල ඇරී" මෙම අවස්ථාව ඔබට සිතෙන පරිදි විචිත්‍රව චිත්‍රණය කරන්න
2. "ඉරිදා පොළට ගිහින්" තේමාව හා සම්බන්ධ සිත්ගත් අවස්ථාවක් සිත්තම් කරන්න.
3. "අලි ඇතුන් නාවන දිය මංකඩක්" (අලි ඇතුන් නාවමින් සිටින ආකාරය ඔබ සිත්ගත් පරිදි චිත්‍රණ... කරන්න.

**මෝස්තර හා ග්‍රැෆික් චිත්‍ර**

4. ළමයින්ට සුදුසු ඇඳ ඇතිරිල්ලක් සඳහා ව්‍යාප්ත මෝස්තරයක් සත්ව හෝ කාටූන් රූප භාවිතයෙන් ඇ... වර්ණ කරන්න.
5. ලීයෙන් තැනූ දොරකට සුදුසු කැටයමක් සාම්ප්‍රදායික සත්ව රූ භාවිතයෙන් ඇඳ වර්ණ කරන්න.
6. පලතුරු වර්ගයකින් නිෂ්පාදිත පැණි බීම වර්ගයක් සඳහා සුදුසු ලේබලයක් ඇඳ වර්ණ කරන්න
7. පාසලේ පැවැත්වීමට නියමිත චිත්‍ර ප්‍රදර්ශනය ප්‍රචාරය කිරීමට සුදුසු පෝස්ටරයක් නිර්මාණය කරන්න

(ලකුණු 3...



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk